# කන්දඋඩ ආරච්චිගේ චන්ද්‍රප්‍රේම

ජිනීවා නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයට ශ්‍රී ලංකාවේ රජය විසින් අභිනවයෙන් නම්කර ඇති නියෝජිතයා වන සී.ඒ. චන්ද්‍රප්‍රේම[i], රාජ්‍ය අනුග්‍රහ ලද ඝාතක කල්ලියක[ii] ප්‍රකට සාමාජිකයකුව සිටි අතර, සිංහල ජාතික මානව හිමිකම් නීතිඥයන් තිදෙනකු 1989දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු බවට හිටපු පොලිස් නිලධාරියකු විසින් චෝදනා එල්ල කරනු ලැබූ අයෙකි.

80 දශකයේදී මහජන විප්ලවකාරී රතු හමුදාව[iii] හෙවත් ප්‍රා (PRRA) සංවිධානයේ ප්‍රමුඛ සාමාජිකයකු වශයෙන් ක්‍රියාකළ චන්ද්‍රප්‍රේම, පොදු මූලාශ්‍රවල 'තඩි ප්‍රියන්ත'[iv] ලෙස නිරන්තරයෙන් හඳුන්වනු ලැබුණු අතර ඔහු විසින් එය කිසිවිටක ප්‍රතික්ෂේප කරනු ලැබ නැත. ඇස්තමේන්තු කර ඇති ආකාරයට, 1987 - 90 වකවානුව තුළ සිදු වූ දෙවැනි සිංහල තරුණ නැගිටීම සමයේ 40,000ක් සිංහල ජනයා ඝාතනයට ලක්වූහ. ප්‍රා සංවිධානය ශ්‍රී ලංකා හමුදාවන්ට සිය විරුද්ධවාදීන් ඉලක්ක කිරීමට ආධාර කළ අතර මෙකී ගැටුම් සමයේ දහසකට වැඩි ප්‍රමාණයක් ප්‍රා සංවිධානය විසින් ඝාතනය කළ බැව් වාර්තා වේ.[v]

මානව හිමිකම් නීතිඥයන් වූ කාංචන අබේපාල සහ චරිත ලංකාපුර[vi] යන දෙදෙනාඝාතනය කිරීම හා සම්බන්ධව වසර 2000දී චන්ද්‍රප්‍රේම අත්අඩංගුවට ගනු ලැබූ නමුත් පසුව නිදහස් කරනු ලැබුනි.[vii] චන්ද්‍රප්‍රේම සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයාමට නීතිමය පදනමක් නීතිපතිවරයා විසින් නොදක්නා ලද බව මාධ්‍ය වාර්තා[viii] කියා සිටියි. අත් අඩංගුවට ගැනීමට නියමිතව සිටි තවත් ප්‍රා සාමාජිකයකු විසින් ආණ්ඩුවේ නියෝජ්‍ය අමාත්‍යවරයකු අමතා, අතීත සිදුවීම්වලට සම්බන්ධව සිටි ආණ්ඩුවේ සාමාජිකයන් හෙළිකරන බවත්, එවිට 'ඔවුන්ට ලැජ්ජාවෙන් මුහුණ සඟවා ගැනීමට' සිදුවනු ඇති බවට තර්ජනය කළ බවට හෙළිකළ ප්‍රධාන ප්‍රවෘත්තියක් එවකදී 'රාවය' පුවත්පත විසින් පළකළේය.[ix]

චන්ද්‍රප්‍රේම අත්අඩංගුවට ගනු ලැබුණේ, වධහිංසා පමුණුවීම පිළිබඳ තමන්ට ද චෝදනා එල්ල වූ හිටපු පොලිස් නිලධාරියකු 2000 අගෝස්තු 3 වැනිදා[x] අත්අඩංගුවට ගැනීමෙන් පසුව ය. හේ, හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ය. අසූව දශකයේ අග භාගයේදී, 'අතුරුදහන්වීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත් වූ තම පොලිස් සගයන් පැහැරගෙන ගොස් රඳවා තබාගැනීම ඇතුළුව'[xi] එක් වධකාගාරයක් සැළසුම් කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පීරිස් සෘජුව වගකිව යුතු බව රජය විසින් පිහිටුවන ලද විමර්ශන කොමිසමක් විසින් හෙළිකරගනු ලැබුණි. අත්අඩංගුවට ගැනීමෙන් පසු දිවුරුම් ප්‍රකාශයක් මගින් ඩග්ලස් පීරිස් කියා සිටියේ මානව හිමිකම් නීතිඥයන් තිදෙනකු ඇතුළු පුද්ගලයන් සිව් දෙනකු ඝාතනය කිරීමට 'තඩි ප්‍රියන්ත' (හෙවත් චන්ද්‍රප්‍රේම) වගකිව යුතු බව ය.[xii] යෞවනයන් දෙදෙනකු පැහැරගෙන යාම සම්බන්ධයෙන් 2009දී වරදකරු වූ පීරිස්ට බරපතල වැඩ සහිත පස් අවුරුදු සිර දඬුවමක් නියම විය.[xiii]

ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම විසින් එවකට පළකළ වාර්තාවක්[xiv] පෙන්වා දෙන්නේ 1989දී ශ්‍රී ලංකාවේ නීතිඥයන් දස දෙනකු ඝාතනයට ලක් වූ බවයි; ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පීරිස් විසින් හෙළිකළ තිදෙනා ද ඒ අතර වේ.

**චරිත ලංකාපුර - 1989 ජූලි 7 වැනිදා ඝාතනයට ලක්විය:** සිවිල් ඇඳුමින් සැරසුණු දෙදෙනකු විසින් ඔහුගේ ගෙළට වෙඩි තැබූ බව වාර්තාව කියා සිටියි. ආරක්ෂක හමුදා විසින් අත්අඩංගුවට ගනු ලැබීමෙන් පසු අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් හේබියස් කොපුස් පෙත්සම් සිය ගණනක් ඔහු විසින් ගොණු කරන ලද අතර ඒවා නවතන ලෙසට අනතුරු හඟවා දුරකතනය ඔස්සේ ඔහුට මරණ තර්ජන කරනු ලැබුණි. ඔහුගේ මරණයෙන් පසු, ලංකාපුරගේ මරණයට වගකිව යුතු පුද්ගලයා වශයෙන් තමන් හඳුන්වා දුන් අයකු විසින්, කාංචන අබේපාල හා ප්‍රින්ස් ගුණසේකර යන නීතිඥයන් දෙදෙනාට තවදුරටත් නඩු ගොණු කිරීමෙන් වැළකී සිටින ලෙසට දුරකතන මගින් අනතුරු ඇඟවීම් හා මරණ තර්ජන එල්ල කර තිබේ.

**කාංචන අබේපාල - 1989 අගෝස්තු 28 වැනිදා ඝාතනයට ලක්විය:** සිය නිවසේ දොර විවර කළ ඔහුගේ පපුවට වෙඩි පහර දෙකක් එල්ල කෙරුණු අතර ඔහුගේ පසෙකින් සිටි පියාට ද බරපතල තුවාල සිදුවිය. තව එකදු හේබියස් කෝපුස් පෙත්සමක් හෝ ගොණුකළහොත් මරා දමන බවට 1989 ජූලි 7 වැනිදා ඔහුට තර්ජනය කරනු ලැබ තිබුණි. ඔහුට තර්ජනය කළ එක් දුරකතන ඇමතුම්කරුවකු විසින් කියා සිටියේ ඔහුගේ නම ඝාතන ලැයිස්තුවක ඇති බව ය.

**1989 ඔක්තෝබර් 3 වැනිදා පැහැරගනු ලැබූ ගම්පහ ප්‍රදේශයේ නීතිඥයකු වූ නෙවිල් නිශ්ශංක**ගේ මළ සිරුර පසුදා ඔහුගේ නිවස ඉදිරිපිට දමාගොස් තිබියදී හමුවිය.

පොදු මහජන පරිශීලනය පිණිස අන්තර්ජාලයේ ද මේ වනවිට ඇති ඔහුගේ දිවුරුම් ප්‍රකාශය[xv] මගින් පීරිස් ප්‍රකාශ කර ඇත්තේ, තමා තඩි ප්‍රියන්තට (හෙවත් චන්ද්‍රප්‍රේම) හඳුන්වා දෙනු ලැබුවේ ආණ්ඩුවේ ඇමතිවරයකු වූ (පසුව දෙවරක් අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත් වූ) රනිල් වික්‍රමසිංහ විසින් බව ය. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ පිළිබඳ, අධිකරණය හමුවේ කිසිවිටක විභාග නොකළ හා තහවුරු නොකළ විශ්මය දනවන චෝදනාවන් ද පීරිස් ස්වකීය දිවුරුම් ප්‍රකාශය මගින් එල්ල කරනු ලැබුනි.

> *"රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් අනුව, තඩි ප්‍රියන්ත විසින් නායකත්වය දුන් කණ්ඩායම විසින් පහත නම් සඳහන් පුද්ගලයන් ද ඝාතනය කළ බව මම දනිමි: (i) කැළණිය ටයර් සංස්ථාවේ සේවය කළ පෙරේරා නමැති පුද්ගලයා (ii) හල්ෆ්ට්ස්ඩෝෆ්හි නීතිඥයකු වූ දයා ලංකාපුර මහතා (iii) හල්ෆ්ට්ස්ඩෝෆ්හි නීතිඥයකු වූ කාංචන අබේපාල මහතා (iv) ගම්පහ ප්‍රදේශයේ නීතිඥයකු වූ නිශ්ශංක මහතා. රනිල් වික්‍රමසිංහ මහතාට සමීප හමුදා ලුතිනන් නිශ්ශංක හා සේනානායක යන දෙදෙනා විසින් නායකත්වය සපයන කඳ කණ්ඩායම, රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් අනුව ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිවිල් ඇඳුමින් සැරසී මෙහෙයුම් සිදුකළ බව මම දැන සිටියෙමි".*

1994 සිට, අගමැති හෝ ජනාධිපති ධූරයේ කටයුතු කළ සිව් දෙනකු ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ආධිපත්‍යය දරා තිබේ - එනම්, චන්ද්‍රිකා කුමාරණතුංග, රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ හා දැන් ඔහුගේ සහෝදරයා වන ගෝඨාභය රාජපක්ෂ ය. ඉහත සිද්ධියට අදාළව යුක්තිය හඹා නොයෑමට හේතු මේ සෑම අයකුටම තිබේ. අසූව දශකය අග භාගයේදී චන්ද්‍රිකා කුමාරණතුංග ද ඇතුළත්ව සිටි වාමාංශික සන්ධානයකට සහාය දැක් වූ ශිෂ්‍ය කණ්ඩායමකට චන්ද්‍රප්‍රේම සම්බන්ධව සිටියේය. ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල සමයේ ආණ්ඩුවේ ඇමතිවරයකු වශයෙන් රනිල් වික්‍රමසිංහ කටයුතු කළ අතර ඔහුගේ මාධ්‍ය උපදේශකයා වශයෙන් චන්ද්‍රප්‍රේම කලක් ක්‍රියා කළේය. ගෝඨාභය රාජපක්ෂගේ නිල චරිතාපදානය චන්ද්‍රප්‍රේම විසින් ලියන ලද අතර, ජවිපෙ නැගිටීම මර්දනය කළ සමයේ ගෝඨාභය රාජපක්ෂ හමුදා නිලධාරියකු වශයෙන් ක්‍රියා කළේය.

ජවිපෙ සමයේ සිදු වූ සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් මෙන්ම, 2009 දී නිමා වූ අභ්‍යන්තර අවි ගැටුමට සම්බන්ධ යුද අපරාධ සම්බන්ධයෙන් ද පූර්ණ දණ්ඩ මුක්තියක් ප්‍රදානය වී තිබේ. මෙකී චකවානු දෙකට අදාළ ක්‍රියා පිළිවෙත් හා අපරාධ රටා අතර ඇදහිය නොහැකි තරම් සාම්‍යයක් පවතී: අවනීතික හා බලහත්කාරී රඳවා තබාගැනීම්, සුදු වෑන් පැහැරගැනීම්, බලහත්කාරී අතුරුදහන් කිරීම් හා රාජ්‍ය අනුග්‍රහ ලද ත්‍රස්තවාදය සම්බන්ධයෙන් සියළු අනුයාත පාලන තන්ත්‍රයන්ට එල්ලවන චෝදනාවන්ගෙන් දෑත් පිරිසිදු කරගැනීමට කිසිවකු සමත් වී නොමැත. මේ හේතුවෙන් මෙකී අපරාධ සම්බන්ධයෙන් කිසිවකු වගඋත්තරකරුවන් කිරීමේ වාසියක් කිසිවකුට නොමැති අතර දණ්ඩ මුක්තිය මුල් බැස ඇත්තේ ඒ නිසා ය.

## ප්‍රා - මහජන විප්ලවකාරී රතු හමුදාව

'ප්‍රා' (PRRA) වනාහී විශාල සන්නද්ධ සංවිධානයක් නොවන අතර ඒ සම්බන්ධයෙන් ලියා ඇති ලේඛකයන් විසින් ඇස්තමේන්තු කර ඇත්තේ සාමාජිකයන් 40ක් පමණ ඒ හා සම්බන්ධව සිටි බව ය[xvi]. 1988 අගෝස්තු මාසයේ දී[xvii] පිහිටුවන ලද ඝාතක කල්ලියක් වූ ප්‍රා සංවිධානය යුද හමුදාව සහ හමුදා බුද්ධි ඒකක සමග සමීපව කටයුතු කළ අතර, ජවිපෙ සැකකරුවන් ඉලක්ක කිරීම සඳහා ඇතැම් දෙමළ සටන්කාමී සංවිධානවල[xviii] සහාය ඊට ලැබුණි. 1989දී ප්‍රා සංවිධානයට හමුදාවෙන් ආයුද ලැබුණු බවට ලේඛකයන් දෙදෙනකු කියා සිටියි.[xix] අසූව දශකයේ අග භාගයේ සිදු වූ සරසවි සිසුන් 200 දෙනකු ඇතුලු 1,222 දෙනකුගේ මරණයන්ට ප්‍රා සංවිධානය වගකිව යුතු බව එක් අයකු ඇස්තමේන්තු කර තිබේ.[xx] මාධ්‍යවේදීන් හා නීතිඥයන් ද ඔවුන් විසින් ඉලක්ක කරනු ලැබුණි;[xxi] මාධ්‍යවේදී එච්.ඊ. දයානන්ද 1988 දෙසැම්බර් 3 වැනිදා ප්‍රා සංවිධානය විසින් ඝාතනය කළ බව[xxii] ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය ප්‍රකාශ කරන ලද අතර, තවත් ක්ෂමා සංවිධාන වාර්තාවක් චෝදනා කර සිටින්නේ 1989දී ඇඹිලිපිටිය ප්‍රදේශයේ 16 හැවිරිදි දරුවකු හා ඔහුගේ මයිලණුවන්ගේ අතුරුදහන්වීමට ප්‍රා සංවිධානය සම්බන්ධ බව ය.[xxiii]

ප්‍රා සංවිධානය විසින් ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය හඳුන්වනු ලැබුවේ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ය. 1991 ජූනි 4 වැනිදා, කොළඹ දී ප්‍රා සංවිධානයෙන් දුරකථනය ඔස්සේ මරණ තර්ජන එල්ල වූ බව ක්ෂමා සංවිධානයේ

පර්යේෂිකාවක් ආවර්ජනය කරනු ලැබුවාය; සැලසුම් කර තිබූ ප්‍රසිද්ධ වැඩසටහනක් නැවැත්වීමට බලපෑ හේතුව මෙකී තර්ජනය බැව් ක්ෂමා සංවිධාන වාර්තාවක ද සඳහන් කර තිබේ.[xxiv]

ප්‍රා සංවිධානය සම්බන්ධයෙන් 1990 ක්ෂමා සංවිධාන වාර්තාවක මෙසේ දැක් වේ: *"මරණ සම්බන්ධයෙන් වගකීම මෙකී සංවිධාන විසින් භාරගන්නා බව දැක්වෙන දැන්වීම් මළ සිරුරු සමග දමාගොස් තිබේ. ඔවුන්ගේ නමින් පෝස්ටර් සහ ලියුම් මගින් ද මරණ තර්ජන එල්ල කර ඇත. මළ සිරුරු අසළ පෝස්ටර් දමා යෑම සහ ලියුම් මගින් තර්ජන එල්ල කිරීම ජවිපෙ විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදයන් ප්‍රතිරාවය කිරීමකි."*[xxv]

පහතින් දැක්වෙන සේයා රූ යුග්මය[xxvi], 1988 දෙසැම්බර් මස මාතර තිහගොඩ ප්‍රදේශයේ දී ගන්නා ලද ඒවා ය. මළ සිරුරු දෙකකට ගැටගසන ලද එකම ආකාරයේ දැන්වීම් දෙකකින් කියැවී තිබුණේ, ***"ජාතියේ අවාසනාවට බිහි වූ විජේවීර දේශ ද්‍රෝහියාගේ අලුගෝසුවන්ට, අහිංසක පුරවැසියන් මරා දැමීම නිසා හිමිවන දඬුවම මරණයයි - ප්‍රා"***






1988-89 මැතිවරණවලදී ඡන්දය වර්ජනය කිරීමේ ව්‍යාපාරයක් දියත් කළ ජවිපෙ සිය අණ නොතකන අය මරා දමන බවට තර්ජනය කළේය. ඊට සමාන්තර ත්‍රස්තය පැතිරවීමේ ව්‍යාපාරයක් දියත් කළ ප්‍රා සංවිධානය, ඡන්දය වර්ජනය කරන්නන් මරා දමන බවට තර්ජනය කර සිටියේය. පහතින් ඇති පෝස්ටරයේ මෙසේ දැක් වේ: ***"ඡන්දය වර්ජනය කරන්නන්ට දඬුවම මරණය - ප්‍රා"***[xxvii]



[xxviii]

2015 දී ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ධූරයට පත්, එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ මංගල සමරවීරට යවන ලද පහත දැක්වෙන ලිපිය වැනි තර්ජනාත්මක ලිපි ද ප්‍රා සංවිධානය විසින් සිවිල් සමාජ සාමාජිකයන් හා මාධ්‍යවේදීන්[xxix] ඉලක්ක කොට නිකුත් කරනු ලැබුණි.


මහජන විප්ලවකාරී රතු හමුදාව

1991.02.13
4 වන බල ඇණිය
ක්‍රියාත්මක ඒකක
ප්‍රා - රෙජිමේන්තුව
කොළඹ.

මංගල සමරවීර මහතා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මාතර දිස්ත්‍රික්කය

මහත්මයාණෙනි,

මව්වරුන්ගේ පෙරමුණේ රැලිය තහනම් කිරීම

අපගේ වීර සෙබලුන් මහත් පරිශ්‍රමයෙන් උදාකල සාමය ඉදිරියටත් රැක ගැනීමට පහත නියෝග නිකුත් කරමි.

1. පෙබ. 19 රැලිය නැවැත්විය යුතුය. ඒ බව ජන මාධ්‍යවලට දැනුම් දිය යුතුය.
2. රටතුල හා පිටරට වලට තොරතුරු සැපයීම වහාම නතර කල යුතුය.
3. ඇම්නෙස්ටි, ආර් කල් 19 වැනි සංවිධාන සමග සම්බන්ධකම් වහාම නැවැත්විය යුතුය.

මෙම නියෝග කඩකිරීම බරපතල විපාක වලට මුහුණ දීමට [illegible].

ආණා පරිදි,

විධායක අධිකාරී
කපිතාන් සිරිවර්ධන R
(4 - ශ්‍රී. ල. ප්‍රා)

- ප්‍රා -

"මහජන විප්ලවකාරී රතු හමුදාව

1991.02.13
හතරවන බල ඇණිය
ක්‍රියාන්විත ඒකක
ප්‍රා - රෙජිමේන්තුව
කොළඹ

මංගල සමරවීර මහතා
පාර්ලිමේන්තු මන්ත්‍රී
මාතර දිස්ත්‍රික්කය

මහත්මයාණෙනි,

මව්වරුන්ගේ පෙරමුණේ රැලිය තහනම් කිරීම

අපගේ වීර සෙබළුන් මහත් පරිශ්‍රමයෙන් උදාකළ සාමය ඉදිරියටත් රැකගැනීමට පහත නියෝග නිකුත් කරමි.

1. පෙබ. 19 රැලිය නැවැත්විය යුතු ය. ඒ බව ජනමාධ්‍යවලට දැනුම්දිය යුතු ය.

2. රට තුළ හා පිටරටවලට තොරුතුරු සැපයීම වහාම නතර කළ යුතු ය.

3. ඇම්නෙස්ටි, ආටිකල් 19 වැනි ත්‍රස්තවාදී සංවිධාන සමග සම්බන්ධකම් වහාම නැවැත්විය යුතු ය.

මෙම නියෝග කඩකිරීම බරපතල විපාකවලට මුහුණදීමට සිදුවීමකි.

අණ පරිදි,

විධායක අධිකාරී
කපිතාන් සිරිවර්ධන R
(4 - ශ්‍රී.ල.ප්‍රා)”

*මූලාශ්‍ර*

---

[i] *Veteran columnist C.A.Chandraprema appointed as Lankan envoy at the UN in Geneva,* Menafn, https://menafn.com/1099570738/Veteran-columnist-CAChandraprema-appointed-as-Lankan-envoy-at-the-UN-in-Geneva
සහ : https://newsin.asia/veteran-columnist-c-a-chandraprema-appointed-as-lankan-envoy-at-the-un-in-geneva/

[ii] Political violence and its cultural constructions : representations & narrations in times of war, de Silva, P.L, 2000, බලන්න පහත සබැඳිය https://docplayer.net/85187156-Political-violence-and-its-cultural-constructions-representations-narrations-in-times-of-war-de-silva-p-l.html, 3 වැනි පිටුවෙහි දැක්වෙන්නේ ‘ආණ්ඩුවට සම්බන්ධ හෝ රහසිගත අනුමැතිය ලද ඝාතක කල්ලි’ වශයෙනි. චන්ද්‍රප්‍රේම ප්‍රචණ්ඩ දේශපාලනයේ නිරතවූවන්ට අතිශය සමීප අයකු බව 179 වැනි පිටුවේ දැක් වේ.

[iii] *“The beginnings of the PRRA are connected with the formation of death squads, mainly under leading UNP politicians. With the multiplication of these squads, they were loosely linked through a hierarchy of government politicians, military co-ordinating officers and police officers..”.*
The PRRA Killer’s Diary: Ranil W, Rajitha R And The Left, Rajan Hoole, 1989: The Eclipse of the JVP and the Perplexity of the Left – Part 3, *The PRRA (Peoples Revolutionary Red Army)*
https://www.colombotelegraph.com/index.php/the-prra-killers-diary-ranil-w-rajitha-r-and-the-left/

[iv] Multiple media references confirm this as well as experts on the period and a person in Sri Lanka who knew him in the eighties (where this was his rather unflattering nickname at university) and another individual who was a contemporary at university; furthermore Chandraprema has never challenged multiple public sources that call him Thadi Priyantha.
17 Aug 2000, Dinamina (Sinhala; state run media) headline story: *CA Chandraprema arrested for killings carried out as Thadi Priyantha.*
‘තඩි ප්‍රියන්ත’ සම්බන්ධයෙන් කියවා බලන්න: JDS Lanka, 15 Nov 2019.
http://www.jdslanka.org/s/index.php/2014-12-24-03-23-00/2014-12-24-03-25-15/896-2019-11-15-09-06-09
මාතලේ මිනිස් දඩබිම: 'යකඩ පොල්ලකින් ඔළුවලට ගහලා උරහිස් දෙපැත්තට ඇණ ගැහුවා'
තවදුරටත් කියවා බලන්න: http://www.srilankaguardian.org/2012/12/impeachment-motion-against-chief-justice.html December 5, 2012, Colombo, Sri Lanka Guardian) “A friend of mine who knew this man who known as ‘Thadi Priyantha’ since 1980’s as a controversial character suspected of having a hand in the 1988/1989 JVP insurrection, posted a column written by him to the “Wham Ivura” of Divaina Sinhala Daily paper for me to read it.”

සහ: https://www.sangam.org/PIRABAKARAN/Part23.htm which says: “C.A.Chandraprema *alias* Thadi Priyantha.”
සහ: http://twonationsoneisland.blogspot.com/2015/03/gota-rajitha-chandraprema-meeting.html
පිරිමි රැඳවියන්ට එරෙහිව ලිංගික හිංසන කිරීම පිළිබඳව අමාත්‍යවරයකු විසින් ඔහුට කරන ලද චෝදනාව තවත් මූලාශ්‍රයක් විසින් අප වෙත තහවුරු කරනු ලැබුණි: “*What right does Thadi Priyantha (an alias used by C.A. Premachandra) have to question my morals? That fellow had killed hundreds of people together with “Pra.” He is responsible for the deaths of Charitha Lankapura and Kanchana Abepala.” – said by then Public Relations Minister Mervyn Silva.*
http://www.elakiri.com/forum/showthread.php?t=1215915
“C.A. Chandraprema aka Thadi Priyantha (a recent biographer of presidential sibling Gotabhaya Rajapaksa)”, http://ceylon-ananda.com/kanagasabai-k-gunaratnam-1917-1989/

[v] ජවිපෙ නැගිටීම පිළිබඳ සිංහල බසින් ලියැවුණු වෙලුම් දෙකකින් යුතු කෘතියක් මෑත දී පළ කෙරුණි. කෘතියේ කතුවරයා ගෝඨාභය රාජපක්ෂගේ දැඩි ආධාරකරුවකු වන අතර 2020 ජනවාරියේදී ඔහු ලේක් හවුස් ආයතනයේ 'සිළුමිණ' පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා වශයෙන් පත්කරනු ලැබුණි. ප්‍රා සංවිධානය 1222 ජනයා ඝාතනය කළ බවට දැක්වෙන්නේ 2016 දෙසැම්බරයේදී පළ කළ ධර්මන් වික්‍රමරත්න විසින් ලියන ලද *ජවිපෙ දෙවැනි කැරැල්ල (වෙළුම 1)* *කෘතියේ 236 හා 243 පිටුවල ය.*

එමෙන්ම, ආණ්ඩුවේ Sunday Observer පත්‍රයේ 1991 පෙබරවාරි 17 වැනිදා ප්‍රධාන සිරස්තලය මගින් ප්‍රා සංවිධානය විසින් ඝාතනය කළ සිසුන් සිව් දෙනකුගේ නම් සඳහන් වේ.

තවද: "ජවිපෙ මගින් සිදු කරන වාමාංශිකයන් ඝාතනයට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම සඳහා ප්‍රා සංවිධානය ගොඩ නැගීමේ මූලික සාකච්ඡාව රජයේ ලිපිකරු සේවා සංගමයේදී පැවතුණේ 1988 මැයි 18වැනිදාය.... ප්‍රා සංවිධානයෙන් ඝාතනය කරන ලද සංඛ්‍යාව 1,200ක් වූ අතර ඒ අතර සිටි සරසවි සිසුන් 200කට ආසන්න පිරිසක් මරා දැමුවේ ධර්මසිරිගේ නායකත්වයෙන් යුත් ස්වාධීන ශිෂ්‍ය සංගමය මගිනි." http://lankanewsweb.org/archives/461

[vi] Chandraprema's bail application put off for October 17, The Island, 4 Oct 2000, http://www.island.lk/2000/10/04/news03.htm
[vii] http://www.island.lk/2000/10/03/news05.html
http://www.island.lk/2000/10/18/news08.html
http://www.lankalibrary.com/phpBB/viewtopic.php?f=20&t=1171
[viii] http://www.island.lk/2000/10/18/news08.html
"…the Attorney General informing the CID that there were no legal grounds to proceed with the prosecution of Mr.Chandraprema. When CID officials informed the Magistrate of the Attorney General's advice Mr.Chandraprema was released… Mr.Chandraprema was not formally charged of any offence." http://www.island.lk/2000/11/09/news01.html
*November 9, 2000 - The Island*

[ix] " බටලන්දෙන් පෙරමුණටත් ප්‍රශ්න' – 2000 අගෝස්තු 20, 'රාවය' ප්‍රධාන සිරස්තල පුවෘත්තිය
[x] *Douglas Pieris sings another song,* http://www.island.lk/2000/10/23/news14.html
[xi] *Human Rights Prosecutions in Democracies at War,* By Moira Lynch, P 59
https://books.google.co.uk/books?id=Cf5uDwAAQBAJ&pg=PA59&lpg=PA59&dq=Senior+Superintendent+of+Police+Douglas+Peiris&source=bl&ots=4XG6sIFjHN&sig=ACfU3U3-e_a5xo8FAswXWQ4D5ugKNGDgBw&hl=en&sa=X&ved=2ahUKEwjT5eqIzY_nAhXTNcAKHSl_D_MQ6AEwBXoECAoQAQ#v=onepage&q=Senior%20Superintendent%20of%20Police%20Douglas%20Peiris&f=false
He confirms this at Ex-SSP Douglas Peiris divulges details in new book
http://www.sundayobserver.lk/2018/12/02/news/ex-ssp-douglas-peiris-divulges-details-new-book on 2 Dec 2018
[xii] එකී සමයේ කළු බළල්ලු, තහ බළල්ලු, උකුස්සෝ, කොළ කොටි සහ ප්‍රා යනාදී වශයෙන් වූ විවිධ ඝාතක කල්ලි රජය විසින් ගොඩනංවා තිබුණි.
[xiii] *Douglas Peiris- One of many crimes,* 29 Aug 2009, Basil Fernando, http://www.srilankaguardian.org/2009/08/douglas-peiris-one-of-many-crimes.html
[xiv] From the ICJ report https://www.icj.org/wp-content/uploads/1990/07/attacks-on-justice-july-1989-june-1990-publications-1990-eng.pdf
[xv] https://www.scribd.com/document/274464279/Ranil-Batalanda-SSP-Douglas-Peiris සහ
http://www.lankaweb.com/news/items/2017/12/29/affidavit-of-former-senior-superintendent-of-police-douglas-peiris-in-august-2010-revealing-mr-ranil-wickramasighes-involvement-in-the-affidavit-sworn-translation/
තවද, http://www.island.lk/2000/10/23/news14.html
2010දී http://www.lankaweb.com/news/items/2017/12/29/affidavit-of-former-senior-superintendent-of-police-douglas-peiris-in-august-2010-revealing-mr-ranil-wickramasighes-involvement-in-the-affidavit-sworn-translation/
[xvi] "ජවිපෙ මර්දනය කිරීමේ තීරණාත්මක ලෙස කාර්යභාරයක් ඉටුකළ ප්‍රා සංවිධානයේ පිරිසක් බුද්ධි අංශ සමග ද සබඳතා පවත්වාගෙන ගියහ. ඇතැම් අයට ජාතික සහායක කණ්ඩායම යටතේ වැටුප් ගෙවූහ. හැඳුනුම්පත් ලැබිණි. සාමාජිකයන් සංඛ්‍යාව 40ක් පමණ වූ අතර තව 200කට ආසන්න පිරිසක් එහි හිතවතුන් විය." - ධර්මන් වික්‍රමරත්න / *ජවිපෙ දෙවැනි කැරැල්ල - වෙළුම 1 (*2016 දෙසැම්බර්) 232 පිටුව

[xvii] "ජවිපෙ මගින් සිදුකරන වාමාංශිකයන් ඝාතනයට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම සඳහා ප්‍රා සංවිධානය ගොඩනැගීමේ මූලික සාකච්ඡාව රජයේ ලිපිකරු සේවා සංගමයේදී පැවතුණේ 1988 මැයි 18 ය. ප්‍රා සංවිධානයේ ප්‍රතම ප්‍රතිපත්ති ප්‍රකාශය 1988 අගෝස්තු 1 නිකුත් විය. දෙවන සංශෝධිත ප්‍රා ප්‍රතිපත්ති ප්‍රකාශය 1989 අගෝස්තු 1 නික්තු විය." ධර්මන් වික්‍රමරත්න / *ජවිපෙ දෙවැනි කැරැල්ල - වෙළුම 1 (*2016 දෙසැම්බර්) 232 පිටුව

[xviii] PLOTE, TELO සංවිධාන දැක් වූ දායකත්වය සඳහා *The Separatist Conflict in Sri Lanka: Terrorism, Ethnicity, Political Economy* By Asoka Bandarage, P 144
[xix] *"තඩි ප්‍රියන්ත නමින් හැඳින් වූ සී. ඒ. චන්ද්‍රප්‍රේම රනිල් වික්‍රමසිංහ මහතාගේ සමීපතම මාධ්‍ය උපදේශකයෙක් වන අතර ජෙනරාල් රන්ජන් විජේරත්න දේශපාලන විද්‍යා පීඨයේ උපදේශකවරයෙකි." – 'දිනමිණ' / 2000 අගෝස්තු 17 (10 වැනි පිටුව)*
[xx] ධර්මන් වික්‍රමරත්න / *ජවිපෙ දෙවැනි කැරැල්ල - වෙළුම 1 (*2016 දෙසැම්බර්)

[xxi] "බටලන්ද වධකාගාරය කළ බළල්ලු සංවිධානය මගින් මෙහෙයවූ අතර ඒ සමග ද ප්‍රා සංවිධානය හොඳ ගණුදෙනුවක් තිබිණි. ප්‍රා නායකයන් කර්නල් ජානක පෙරේරාගෙන් 1989 අප්‍රේල් සහ මැයි මාසයේ වාර දෙකකදී අවි ලබාගත් බවට වාර්තා වේ." ධර්මන් වික්‍රමරත්න / *ජවිපෙ දෙවැනි කැරැල්ල - වෙළුම 1 (*2016 දෙසැම්බර්) – 234 පිටුව

[xxii] "PRRA's name began to be used earlier. For example, the killing of H.E. Dayananda in Colombo in December 1988 was attributed to the PRRA." 70 පිටුව
https://www.amnesty.org/download/Documents/200000/asa370211990eng.pdf

[xxiii] මෙහි වින්දිතයන් වූයේ 1. නම්මුනි ආරච්චිගේ වාදර සුදර්ශන ජයන්ත (වයස 16), ඇඹිලිපිට මධ්‍ය මහා විද්‍යාලයේ සිසුවෙකි. 2. නම්මුනි ආරච්චිගේ ජයතිලක (වයස අවු. 27), ඇඹිලිපිටිය. *"A group of army officers dressed in civil clothes travelling in a white van who said that they belonged to the People's Revolutionary Red Army (PRRA), a death squad linked to the security forces. They forced their way into the house. There were witnesses to the arrest."* P11,
https://www.amnesty.org/download/Documents/196000/asa370181991en.pdf

[xxiv] It described a "threat received on 4 June 1991 from somebody claiming to be acting on behalf of the People's Revolutionary Red Army (PRRA), one of the "death squads" operating in Sri Lanka in recent years.."
https://www.amnesty.org/download/Documents/196000/asa370141991en.pdf

[xxv] https://www.amnesty.org/download/Documents/200000/asa370211990eng.pdf
https://apeyrata.wordpress.com/2015/01/28/rajitha-the-yahapalana-spoke-person/ සේයාරුව බලන්න.

[xxvi] මෙම සේයා රූ කැමරාවට හසුකරගත් ඡායාරූප ශිල්පියා වන්නේ රොබට් නිකල්ස්බර්ග ය. (Robert Nickelsberg//Time Life Pictures/Getty Images.) https://www.robertnickelsberg.com/about

[xxvii] මෙම පෝස්ටරය 1988 දෙසැම්බර් ජනාධිපතිවරණ සමයේ හෝ 1989 පෙබරවාරි පාර්ලිමේන්තු මැතිවරණ සමයේ අලවන ලද්දකි.

[xxviii] බලන්න, පිටුව 16, ජාත්‍යන්තර ක්ෂමා සංවිධාන වාර්තාව.
https://www.amnesty.org/download/Documents/200000/asa370211990eng.pdf

[xxix] නිදසුනක් වශයෙන්, කාර්යාලයටත්, නිවසටත් ප්‍රා සංවිධානයෙන් එවන ලද තර්ජනාත්මක ලිපි ගැන සිංහල මාධ්‍යකරුවකු විසින් අප හා ආවර්ජනය කළේය.